ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
Fax 011 286 4051

(02)

මගේ අංකය / எனது இல / My No.

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2022.01.31

චක්‍රලේඛ අංක 2020/4 (I)

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු/ ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

**<u>රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා</u>**

**<u>ඉඩම් ලබාදීමේදී එකවර දීමනාපත්‍ර ලබාදීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2020.02.26 දිනැති 2020/04 චක්‍රලේඛය හා බැඳේ.

02. එම චක්‍රලේඛයේ 4 වන ඡේදයේ I, II, III කොටස් අවලංගු කරන අතර පහත කරුණ ඇතුළත් කරමින් එම චක්‍රලේඛය සංශෝධනය කරනු ලැබේ.

03. නේවාසික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු මත බැහැර කර ඇති ඉඩමක නිවසක් ඉදිකර සංවර්ධනය කර ස්ථිරව පදිංචි වී සිටී නම්, කාලසීමා නියමයකින් තොරව එකවර නිදහස් දීමනාපත්‍රයක් ලබාදීමට කටයුතු කළ හැකිය. එහිදී බදුකරු විසින් ඉඩමේ නොදියුණු වටිනාකම හා වාර මුදල/ දඩ මුදල එකවර ගෙවා දීමනාපත්‍රයක් ලබා ගැනීමට එකඟතාවය පළකරන්නේ නම් නිදහස් දීමනාපත්‍රය සැකසීම සඳහා අවශ්‍ය නිර්දේශ වාර්තා මා වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

04. ඒ අනුව නේවාසික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු පදනම මත බැහැර කර ඇති ඉඩම් සඳහා ප්‍රමාදයකින් තොරව එකවර නිදහස් දීමනාපත්‍ර ලබාදීමට හැකියාව පවතින බැවින් බදුකරුවන් ඒ පිළිබඳ දැනුවත් කිරීමට කටයුතු කළ යුතු වේ. එසේම නේවාසික කටයුතු සඳහා බැහැර කර ඇති ඉඩම් සඳහා දීර්ඝකාලීන බදුකරයක් සැකසිය යුත්තේ සම්පූර්ණ නොදියුණු වටිනාකම එකවර ගෙවීමට ආර්ථිකමය හැකියාවක් බදුකරු සතුව නොමැති අවස්ථාවලදී හා බදුකරු විසින් ඉඩමේ නිවසක් ඉදිකර ස්ථිර පදිංචි වී නොමැති අවස්ථාවලදී පමණි.

05. පළමු බදුකාලය මේ වන විටත් අවසන් වී ඇති අවස්ථාවලදී බදුකරු විසින් එකවර නිදහස් දීමනාපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ මූලික සුදුසුකම් සම්පූර්ණ කර තිබේනම්, නැවත බදුකාලය දීර්ඝ කිරීමක් අවශ්‍ය නොවේ.

06. එසේම නිදහස් දීමනාපත්‍රය ඉල්ලුම් කරන අවස්ථාව වන විටත්, දෙවන බදුකාලයක් සඳහා බදු අනුමැතියක් ලබාගෙන ඇති අවස්ථා වලදී දෙවන බදු කාලය සඳහා නැවත තක්සේරු වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවන අතර පළමු බදුකාලය අවසානයේ අයකළ බදු මුදලට 50%ක් එකතුකර ලබා ගන්නා අගය දෙවන බදු කාලයේ ආරම්භක බදු මුදල සේ සලකා, දීමනාපත්‍රය ඉල්ලුම්කරන දින දක්වා වාර්ෂික බදු මුදල් අයකළ යුතු වේ. දෙවන බදු කාලය සඳහා බදු අනුමැතියක් ලබාගෙන නොමැති වුවද, පළමු බදු කාලය අවසන් වී තිබේනම්, ඉහත පරිදි දෙවන බදු කාලයට අදාළව බදු මුදල් අය කිරීමට කටයුතු කළ යුතු වේ.

07. ඒ අනුව සංශෝධිත සහන පිළිබඳ බදුකරුවන් දැනුවත් කර නේවාසික කටයුතු සඳහා දීර්ඝකාලීනව බදු මත බැහැර කර ඇති ඉඩම් සඳහා නිදහස් දීමනාපත්‍රය ලබාදීමේ කටයුතු කඩිනම් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේදී යම් ගැටළුවක් වෙතොත් මා විමසන්න.

ජී.ඩී. කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කා.දැ.ගැ.ස.
2. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
3. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
4. ප්‍රධාන තක්සේරුකරු - කා.දැ.ගැ.ස.
5. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය